# පඤ්චමො පාඨො

## රමණී



රමණී රූපසම්පන්නා බාලිකා භවති. සා මධුරානි වචනානි භාසති. මාතුයා සද්ධිං විහාරං ගච්ඡති. බුද්ධං වන්දති. පුප්ඵං පූජෙති. තස්සා පිතා එකදා පොත්ථලිකං ආහරිත්වා අදාසි. රමණී පොත්ථලිකාය සද්ධිං කීළති. එකදා තස්සා පොත්ථලිකා භූමියං පති. තස්මිං ඛණෙ පොත්ථලිකා චුණ්ණවිචුණ්ණා භවි. සා අතී'ව සොකාභිභූතා රොදි. මාතා තං දිස්වා කිම'ත්ථාය රොදසීති පුච්ඡි. අත්තනො පොත්ථලිකා මතා'ති සා වදි. සබ්බෙ සත්තා මරිස්සන්ති, මා රොදසීති මාතා ඔවදි.

(පාලි රචනා 1)

**පදමාලාව**

| | | |
|---|---|---|
| **රූපසම්පන්නා** | - | රූපසම්පන්න |
| **සා** | - | ඕ තොමෝ |
| **මධුරානි** | - | මිහිරි |
| **වචනානි** | - | වචන |
| **භාසති** | - | කියයි |
| **මාතුයා සද්ධිං** | - | මව සමග |
| **තස්සා** | - | ඇයගේ |
| **එකදා** | - | එක් දවසක් |
| **පොත්ථලිකං** | - | බෝනික්කා |

ආහරිත්වා - ගෙනවිත්
අදාසි - දුන්නේය
කීළති - සෙල්ලම් කරයි
භූමියං - බිම
පති - වැටුණේය
තස්මිං ඛණෙ - එකෙණෙහි
චුණ්ණාවිචුණ්ණා - සුණු විසුණු
භවි - විය
අතීව - ඉතාම
සොකාභිභූතා - ශෝකයෙන් පෙළුණී
රොදි - හැඬුවේ ය
කිමත්ථාය - කුමක් නිසා
පුච්ඡි - ඇසුවේය
අත්තනො - තමාගේ
මතා'ති - මළා යැයි
වදි - කීවේය/ කීවාය
මරිස්සන්ති - මැරෙන්නෝය
මා රොදසීති - නොහඬන්න යැයි
ඔවදි - අවවාද කළේය

## අභ්‍යාස

**කා** - කවර තැනැත්තියක්
**කං** - කුමක්
**කාය සද්ධිං** - කවර තැනැත්තියක් සමග
**කස්මා** - කුමක් නිසා
**කථං** - කෙසේ

1. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

උදා:- **කා බුද්ධං වන්දති. - රමණී බුද්ධං වන්දති.**

i. කා මධුරානි වචනානි භාසති ?
ii. පිතා රමණියා කං අදාසි ?
iii. රමණී කාය සද්ධිං විහාරං ගච්ඡති?
iv. රමණී කස්මා රොදි ?
v. තස්සා මාතා කථං ඔවදි?

2. පහත දැක්වෙන වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ....................වන්දති,...............පූජෙති.
ii. ........................මධුරානි .................භාසති.
iii. .....................සත්තා මරිස්සන්ති.
iv. මාතා ........................... ඔවදි.
v. .......................පිතා පොත්ථිකං ........................ අදාසි.

## ලිඞ්ග භේදය

පාලි භාෂාවේ ඇති නාම ප්‍රධාන වශයෙන් **පුල්ලිඞ්ගනාම, ඉත්ථිලිඞ්ග නාම, නපුංසකලිඞ්ගනාම** යනුවෙන් ප්‍රභේද තුනකි. යම් නාමයක් කුමන ලිඞ්ගයකට අයත් දැයි හඳුනාගන්නේ ශබ්දාන්තයෙහි ස්වරූපය කෙබඳු දැයි පරීක්ෂා කොට බැලීමෙනි. ඒ අනුව යම් ශබ්දයක පුරුෂවාචී බවක් හැඟේ නම් එය 'පුල්ලිඞ්ග නාම' ලෙස ද, ස්ත්‍රීවාචී බවක් හැඟේ නම් එය 'ඉත්ථිලිඞ්ග නාම' ලෙස ද, පුරුෂවාචී සහ ස්ත්‍රීවාචී බවක් නොහැඟේ නම් එම සියලු නාම 'නපුංසකලිඞ්ග නාම' ලෙස ද හඳුනාගත හැකි ය. ලිඞ්ගත්‍රයට අයත් පහත දැක්වෙන ශබ්ද හදාරන්න.

### පුල්ලිඞ්ගනාම

| | | | | |
|---|---|---|---|---|
| පුරිස | භික්ඛු | ගො | රාජ | නර |
| වානර | ධම්ම | අත්ත | කවි | රුක්ඛ |
| අග්ගි | දෙව | | | |

### ඉත්ථිලිඞ්ගනාම

| | | | | |
|---|---|---|---|---|
| වනිතා | ලතා | මිගී | ධෙනු | මෙධා |
| බුද්ධි | වධූ | වසුධා | යාගු | නදී |
| මායා | කඤ්ඤා | | | |

**නපුංසකලිඞ්ගනාම**

චිත්ත අට්ඨි ඵල රූප ධන
පුඤ්ඤ පාප නයන දාන

**අලිංගික නාම**

අම්හ තුම්හ

**ඉත්ථිලිඞ්ග ශබ්ද හඳුනාගැනීම**

මීට ඉහත පාඩම්වලදී අකාරාන්ත පුල්ලිංග 'දෙව', ඉකාරාන්ත 'අග්ගි', උකාරාන්ත 'භික්ඛු' ශබ්ද ඉගෙනගෙන ඇත්තෙමු. මෙම පාඩමෙන් ඉත්ථිලිංග ශබ්දයක් වරනගා අර්ථ ගන්වන අයුරු ඉගෙන ගනිමු.

**ඉත්ථිලිංග 'ඊ 'කාරාන්ත 'නදී ' ශබ්දය**

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | නදී | නදී, නදියො, නජ්ජො |
| ආලපන | (හෙ) නදී | (හෙ)නදී, නදියො, නජ්ජො |
| දුතියා | නදිං | නදී, නදියො, නජ්ජො |
| තතියා | නදියා, නජ්ජා | නදීහි, නදීභි |
| කරණ | නදියා, නජ්ජා | නදීහි, නදීභි |
| චතුත්ථී | නදියා, නජ්ජා | නදීනං |
| පඤ්චමී | නදියා, නජ්ජා | නදීහි, නදීභි |
| ඡට්ඨී | නදියා, නජ්ජා | නදීනං |
| සත්තමී | නදියා, නදියං, නජ්ජං | නදීසු |

ඉත්ථිලිංග 'ඊ 'කාරාන්ත 'නදී' (නදිය හෙවත් ගංගාව) ශබ්දයේ අර්ථය

| විභක්තිය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | නදිය | නදීහු |
| ආලපන | එම්බා නදිය | එම්බා නදීහු |
| දුතියා | නදිය | නදීන් |
| තතියා | නදිය විසින් | නදීන් විසින් |
| කරණ | නදිය කරණකොට | නදීන් කරණකොට |
| චතුත්ථි | නදියට | නදීන්ට |
| පඤ්චමී | නදියෙන් | නදීන්ගෙන් |
| ඡට්ඨී | නදියේ | නදීන්ගේ |
| සත්තමී | නදියෙහි | නදීන්හි |

ඉත්ථිලිඞග 'ඊ 'කාරාන්ත නදී ශබ්දයට සමාන ව වරනැගෙන ශබ්ද කිහිපයක් පහත දැක්වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| මහී | - | පොළොව | කුමාරී | - | කුමරිය |
| වාපී | - | වැව | තරුණී | - | තරුණිය |
| කදලී | - | කෙසෙල් | බ්‍රාහමණී | - | බැමිණිය |
| නාරී | - | ස්ත්‍රිය | සඛී | - | යහළු ස්ත්‍රිය |
| කුක්කුටී | - | කිකිළිය | වානරී | - | වැඳිරිය |
| මිගී | - | මුවදෙන | අජී | - | එළදෙන |

කටපාඩම් කරන්න

මහී වෙතරණී වාපී පාටලී කදලී ඝටී
නාරී කුමාරී තරුණී වාරුණී බ්‍රහමණී සඛී
ගන්ධබ්බී කින්නරී නාගී දෙවී යක්ඛී අජී මිගී
වානරී සූකරී සීහී හංසී කාකී ච කුක්කුටී

## නපුංසක ලිඞ්ග ශබ්ද හඳුනාගනිමු.

මේ වන විට **පුලලිඞ්ග** සහ **ඉත්ථිලිඞ්ග** ශබ්ද කිහිපයක් උගෙන ඇත. නපුංසකලිඞ්ග ශබ්ද කිහිපයක් වරනගා අර්ථගන්වන අයුරු හඳුනාගනිමු.

**අකාරාන්ත නපුංසක ලිඞ්ග 'චිත්ත' (සිත) ශබ්දය**

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | චිත්තං | චිත්තා, චිත්තානි |
| ආලපන | (හෙ)චිත්ත | (හෙ)චිත්තා, චිත්තානි |
| දුතියා | චිත්තං | චිත්තෙ, චිත්තානි |
| තතියා | චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි |
| කරණ | චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි |
| චතුත්ථී | චිත්තාය, චිත්තස්ස | චිත්තානං |
| පඤ්චමී | චිත්තා, චිත්තම්හා, චිත්තස්මා | චිත්තෙහි, චිත්තෙභි |
| ඡට්ඨී | චිත්තස්ස | චිත්තානං |
| සත්තමී | චිත්තෙ, චිත්තම්හි, චිත්තස්මිං | චිත්තෙසු |

අකාරාන්ත නපුංසකලිඞ්ග 'චිත්ත' ශබ්දයට සමානව වරනැගෙන ශබ්ද කිහිපයක් මෙසේය.

| | | |
|---|---|---|
| පුඤ්ඤ | - | පින |
| පාප | - | පාපය |
| ඵල | - | ගෙඩිය |
| රූප | - | රූපය |
| සොත | - | කන |
| ඝාන | - | නාසය |
| ලොචන | - | ඇස |
| දාන | - | දානය |
| ධන | - | ධනය |
| සීල | - | ශීලය |

## අකාරාන්ත නපුංසකලිඞ්ග 'චිත්ත' ශබ්දයේ අර්ථය

| විභක්තිය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | සිත | සිත්, සිත්හු |
| ආලපන | එම්බා සිත! | එම්බා සිත් ! |
| දුතියා | සිත | සිත් |
| තතියා | සිතින් | සිත්වලින් |
| කරණ | සිතින්, සිත කරණකොට | සිත්වලින්, සිත් කරණකොට |
| චතුත්ථී | සිතට | සිත්වලට |
| පඤ්චමී | සිතෙන් | සිත්වලින් |
| ඡට්ඨී | සිතේ | සිත්වල |
| සත්තමී | සිතෙහි | සිත්වල |

### කටපාඩම් කිරීමට

පුඤ්ඤ පාප ඵල රූප සාධනං
සොත ඝාන සුඛ දුක්ඛ කාරණං
දාන සීල ධන ඣාන ලොචනං
මූල කූල බල ජාල මඞ්ගලං

නලින ලිඞ්ග මුඛඞ්ග ජලම්බුජං
පුලින ධඤ්ඤ හිරඤ්ඤ පදාමතං
පදුම පණ්ණ සුසාන වනායුධං
හදය චීවර වත්ථ කුලින්ද්‍රියං

නයන වදන යානො'දාන සොපාන පානං
භවන භුවන ලොහා'ලාත තුණ්ඩණ්ඩ පීඨං
කරණ මරණ ඤාණා'රම්මණා'රඤ්ඤ තාණං
තගර නගර තීරච්ඡත්ත ඡිද්දොදකානි

## අභ්‍යාස

1. 'රමණී' පාලි පාඨය සිංහලට නගන්න.
2. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ලිංග තුන නම් කරන්න.
ii. ලිංගත්‍රයට අයත් ශබ්ද හඳුනා ගන්නේ කෙසේ දැයි පෙන්වා දෙන්න.
iii. ලිංගත්‍රයට අයත් නාම පහ බැගින් ලියා දක්වන්න.
iv. 'කුමාරී' ශබ්දය වරනඟා එහි තේරුම ලියා දක්වන්න.
v. 'ඵල' ශබ්දය වරනඟා එහි තේරුම ලියා දක්වන්න.

3. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. පුත්තා ධම්මං උග්ගණ්හාති.
ii. මිත්තා සීහෙ ඔලොකෙන්ති.
iii. මනුස්සා සකුණෙ කිණන්ති.
iv. බුද්ධා සාවකානං ධම්මං දෙසෙති.
v. තුම්හෙ බුද්ධස්ස ධම්මං සුණාථ.
vi. කාකා ආකාසෙ උඩ්ඩෙන්ති.
vii. රමණී මිත්තෙන සද්ධිං මග්ගෙ ගච්ඡති.
viii. වාණිජස්ස පුත්තා පොත්ථලිකෙ වික්කිණන්ති.

7. පහත දැක්වෙන වාක්‍ය පාලියට නගන්න.

i. සිංහයෝ මුවන් මරති.
ii. කම්කරුවෝ වැඩ කරති.
iii. මිත්‍රයෝ ගමෙහි සෙල්ලම් කරති.
iv. අපි පන්සලේ දී බුදුන්ගේ ධර්මය අසමු.
v. මව ළමයින්ට ආහාර දෙයි.
vi. අපි වෙළෙන්දාගේ පුතා දකිමු.
vii. රජ දිවයින පාලනය කරයි.
viii. සොරා ගොපල්ලාගේ ගොනෙකු සොරකම් කරයි.

**මිච්ඡා පණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ**

**වරදෙහි යෙදූ සිත නපුරක් කරන්නේ ය.**

(ධම්මපදපාළි, චිත්තවග්ග, 10 ගාථාව)